Learning Resource Center
R
De Mazenod College
Kandana

# ද මැසිනොද් විදුහල - කඳාන

## පළමු වාර පරීක්ෂණය -2025

## කතෝලික ධර්මය

07 ශ්‍රේණිය කාලය: පැය 2යි

2025-05-09

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) දිවැසිවරයා ග්‍රීක බසින් හඳුන්වනු ලබන්නේ,

I. නබී ලෙසිනි. III. ප්‍රොෆෙටස් නමිනි.
II. එසාඩ නමිනි. IV. අගපේ නමිනි.

(02) දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කරගත් ගිවිසුමේ සලකුණ වනුයේ,

I. දේදුන්න III. වෂරාව
II. චර්ම ඡේදනය IV. ගින්දර

(03) ඊසාක් හා රෙබෙකාගේ දරුවන් වනුයේ,

I. ඒසව් හා ජාකොබ් III. මෝසෙස් හා ආබ්‍රහම්
II. ආබ්‍රහම් හා බෙතුසෙල් IV. ලාබන් හා ආබෙල්

(04) ආබ්‍රහම් තුමාගේ ගම ඌර් ය.තම පියා හා නෑදැයින් සමඟ ජීවත් වූයේ හාරාන්හිදීය. එහිදී එතුමා දෙවියන් වහන්සේගේ විශේෂ කැඳවීමක් ලබා යෑමට සිදුවන්නේ,

I. කානාන් III. ආරාම්
II. හාරාන් IV. පාරාන්

(05) සමාජ සාධාරණත්වයේ දිවැසිවරයා යනු,

I. හොසියා දිවැසිවරයා III. ජෝනා දිවැසිවරයා
II. ආමොස් දිවැසිවරයා IV. යෙසායා දිවැසිවරයා

(06) දාවිත් රජතුමා කළ වරද පහදා දුන් දිවැසිවරයා වන්නේ,

I. යෙසායා III. නාතාන්
II. ජෙරමියා IV. මීකා

(07) යෙසායා දිවැසිවරයාගේ නාමේ අර්ථය වන්නේ,

I. දෙවියන් වහන්සේ ගලවන සේක. III. දෙවියන් වහන්සේ ශක්තිමත් කරන සේක.
II. දෙවියන් වහන්සේ උසස් කළ සේක. IV. දෙවියන් වහන්සේ දශර්නය වන සේක.

(08) එළියා දිවැසිවරයා නියඟයේදී ...............................අත්දුටුවේය.

I. දේව විශ්වාසය III. දිව්‍ය සංරක්ෂණය
II. දේව බලය IV. දේව ප්‍රේමය

(09) එසකියෙල් දිවැසිවරයාගේ පියා,

I. ආමොස් ය III. හිල්කියා ය
II. ජෝබ් ය IV. බුසී ය

(10) දෙවියන් වහන්සේ ජෝනා දිවැසිවරයාව කැඳවන ලද්දේ නිනීවයේ වැසියන්ව.............. යොමු කිරීමටය. හිස්තැනට අදාල පිළිතුර වන්නේ,

I. යහපත් මාර්ගයටය
II. කීකරුකමටය
III. මනස්තාපනයටය
IV. බයිබලය පහදා දීමටය

(11) ඊසාක් කුමාව පූජා කිරීමට රැගෙන ගියේ,

I. කානාන් දේශයට
II. ඊශ්‍රායෙල් දේශයට
III. මොරියා දේශයට
IV. හාරාන් දේශයට

(12) පුරාණ ගිවිසුමේ සඳහන් දේශක දිවැසිවරයෙකු වන්නේ,

I. හොසියාය
II. ජෝවෙල්ය
III. නාතාන් ය
IV. එසකියෙල් ය

(13) කර්මෙල් කන්ද මත පූජාවක් සිදුකළ නිවැසිවරයා වන්නේ වන්නේ,

I. නාතාන්
II. එලියා
III. මලාකි
IV. හිල්කියා

(14) පුරාණ ගිවිසුමේ ප්‍රධාන දිවැසිවරුන් ගණන....... කි.

I. 4
II. 5
III. 3
IV. 11

(15) නාමන්ගේ කුෂ්ඨය සුව කළ දිවැසිවරයා වන්නේ,

I. එළියාය
II. එලීෂාය
III. ජෙරමියාය
IV. ජෝනාය

(16) බෙතෙල් යන්නෙහි අර්ථය වන්නේ,

I. දෙවියන් වහන්සේ ගලවන සේක.
II. දෙවියන් වහන්සේගේ කරුණාව.
III. දෙවියන් වහන්සේගේ ගෘහය.
IV. දෙවියන් වහන්සේගේ මිත්‍රයාය.

(17) තම විවාහ දිවිය එක්තරා ආකාරයක දිවැසිවර පණිවිඩයක් කර ගත් දිවැසිවරයා වන්නේ,

I. ආමොස්ය
II. හොසියාය
III. ජෙරමියාය
IV. එසකියල්ය

(18) සත්‍යයට සාක්ෂි දරමින් දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කළ පුද්ගලයින්ව පැරණි ගිවිසුමේ හඳුන්වන්නේ,

I. වීරවරු ලෙසය.
II. රජවරු ලෙසය.
III. දිවැසිවරු ලෙසය.
IV. අයකැමියන් ලෙසය.

(19) "මේ වතුර අපගේ"ය කියමින් ඊසාක්ගේ ගොපල්ලන් සමග කළහ කරන ලද්දේ,

I. කානාන්හි ගොපල්ලන්ය.
II. හාරාන්හි ගොපල්ලන් ය.
III. ගෙරාර් ගොපල්ලන්ය.
IV. මිසරයෙහි ගොපල්ලන්ය.

(20) අප සියලු දෙනාම ශුද්ධ වූ සභාව තුළ දිවැසිවරුන් ලෙස ආලේප කර ඇත්තේ,

I. පූජකවරය මගිනි.
II. අභිවෘද්ධි ආලේපය මගිනි.
III. ආශිවර්ාදකාර බන්ධනය මගිනි.
IV. ප්‍රසාද ස්නාපනය මගිනි.

## II කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

(01)

I. දේශක දිවැසිවරු පිළිබඳව සඳහන් වන ග්‍රන්ථ දෙක කුමක්ද? (ලකුණු 2)
II. දිවැසිවරයා හඳුන්වන හෙබ්‍රිව් හා ග්‍රීක වචනය පිළිවෙලින් ලියන්න. (ලකුණු 2)
III. එලියා දිවැසිවරයා දිව්‍ය සංරක්ෂණය අත්දුටු අවස්ථාවක් ලියන්න. (ලකුණු 2)
IV. ඊසාක් කියන්න නමෙහි අර්ථය ලියන්න. (ලකුණු 2)
V. ලේඛක දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න. (ලකුණු 2)
VI. ජෙරමියා දිවැසිවරයාගේ නමෙහි අර්ථය ලියන්න. (ලකුණු 2)
VII. සුළු දිවැසිවරු හතර දෙනකු නම් කරන්න. (ලකුණු 4)

(02)

I. දේශක දිවැසිවරුන් තිදෙනා නම් කරන්න. (ලකුණු 3)
II. දිවැසිවරයා යන්න කවුරුන්දැයි පහදා දෙන්න. (ලකුණු 3)
III. දේවස්ථානයේ ගරුත්වය ආරක්ෂා කිරීමට ඔබට කල හැකි කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 6)

(03)

I. ප්‍රධාන දිවැසිවරු තිදෙනාගේ නම් ලියන්න. (ලකුණු 3)
II. දිවැසිවරයෙකු ලෙස පාසල් සමාජය තුළ ඔබට කල හැකි කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 3)
III. ඔබ මෙතෙක් ලද සියලු දීමනාවලට දෙවි පියාණන් වහන්සේට තුති පුදා යැදුමක් ලියන්න. (ලකුණු 6)

(04)

I. ආබ්‍රහම් යන නමෙහි තේරුම ලියන්න. (ලකුණු 3)
II. ප්‍රසාද ස්නාපනය මගින් ගිවිසුම් ජීවිතයකට ඇතුල්වූ ඔබට මිසම තුළ කළ හැකි කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 6)
III. ආබ්‍රහම් තුමාට මුහුණ දීමට සිදුවූ අභියෝග තුනක් ලියන්න. (ලකුණු 3)

(05)

I. ආබ්‍රහම් තුමාගේත් කැඳවීමේ අංග දෙක ලියන්න. (ලකුණු 3)
II. ආබ්‍රහම් තුමාට පරිත්‍යාග කිරීමට සිදු වූ දේවල් තුනක් ලියන්න. (ලකුණු 3)
III. ආබ්‍රහම් තුමාගේ කැඳවීම තුළින් අපට ගත හැකි ආදර්ශ තුනක් ලියන්න. (ලකුණු 6)

(06)

I. දේවහඬ හඳුනා ගැනීමට ඔබට සහාය වන පුද්ගලයින් බණ්ඩායම් තුනක් ලියන්න. (ලකුණු 3)
II. ඊසාක් තුමා තුළ තිබූ යහපත් ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 3)
III. ඔබගේ ජීවන ගැටලුවක් සාමකාමී ලෙස ක්‍රියා කිරීම සඳහා ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 6)

(07)

I. ඒසවු හා ජාකොබ් යන නම් වල අර්ථ ලියන්න. (ලකුණු 3)
II. බෙතෙල්හි දර්ශනය කෙටියෙන් ලියන්න. (ලකුණු 3)
III. ඒසව් සමඟ ජාකොබ් සමගිවීමෙන් ඔබට ලබා ගත හැකි ආදශර් තුනක් ලියන්න. (ලකුණු 6)